# මාධ්‍ය නිවේදනය

## "සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන ජාතික තේමාව යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කුරුණෑගල සහ කුලියාපිටිය යන ප්‍රදේශවල රක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරයි

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL), ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL) සමඟ එක්ව දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ අඛණ්ඩ වැඩසටහන් මාලාවේ තෙවන පියවර ලෙස 2026 ජූලි මස 23 සහ 24 යන දිනවල කුරුණෑගල සහ කුලියාපිටිය නගර කේන්ද්‍ර කරගෙන එම ප්‍රදේශවල ප්‍රධාන මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පැවැත්වීමට සූදානම් බව සතුටින් දැනුම් දෙයි.

**"සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්"** යන ජාතික තේමාව යටතේ පවත්වනු ලබන මෙම මුලපිරීමෙහි අරමුණ වන්නේ, රක්ෂණය පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, මූල්‍ය සාක්ෂරතාවය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාව පුරා ප්‍රජාවන් අතර රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවේශය වැඩි කිරීම වේ.

දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව, බැංකුකරුවන්, විශ්වවිද්‍යාල සිසුන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) නියෝජිතයින් සහ මහජනතාව ඇතුළු පුළුල් පරාසයක ප්‍රේක්ෂක පිරිසක් එක් වනු ඇත.

මෙම සැසි මගින් රක්ෂණයේ වැදගත්කම, රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්, පවතින විවිධ රක්ෂණ නිෂ්පාදන සහ සේවා පිළිබඳව මෙන්ම අනපේක්ෂිත මූල්‍ය අවදානම් වලින් පුද්ගලයින්, පවුල් සහ ව්‍යාපාර ආරක්ෂා කිරීමේදී රක්ෂණයේ කාර්යභාරය පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා දෙනු ඇත.

වැඩසටහන් පැවැත් වන දිනයන් සහ ස්ථාන

2026 ජූලි 23 – කුරුණෑගල පළාත් සභා ශ්‍රවණාගාරය

සැසිය 01 – පෙ.ව. 9.30 සිට ප.ව. 12.30 දක්වා
සැසිය 02 – ප.ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

2026 ජූලි 24 – ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය (පෙ.ව. 9.30 සිට ප.ව. 12.30 දක්වා)

මෙම වැඩසටහනේ විශේෂ අංගයක් වන්නේ රක්ෂණ කර්මාන්තයේ මාර්ග දැක්ම වන අතර එය දැනුවත් කිරීමේ සැසිවලට අමතරව දවස පුරා පැවැත්වේ. ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී රක්ෂණ සමාගම් 29ම සහභාගී වන අතර එමඟින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකෙහිම රක්ෂණ උපදේශකයින් හමුවීමට මහජනතාවට වටිනා අවස්ථාවක් සැලසෙනු ඇත.

මෙහිදී මහජනතාවට විවිධ රක්ෂණ නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳව දැනුවත් වීමට, රක්ෂණ ආශ්‍රිත ගැටළු පැහැදිලි කර ගැනීමට සහ කර්මාන්ත වෘත්තිකයන්ගෙන් මග පෙන්වීම ලබා ගැනීමට හැකිය. රක්ෂණ කර්මාන්තයේ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් ද සහභාගී වන අතර, එමඟින් මහජනතාවට රක්ෂණ අංශය සහ එමඟින් පිරිනමන සේවාවන් වඩා හොඳින් අවබෝධ කර ගැනීමට ඉඩ සලසයි.

මෙම වැඩමුළුවන්හි වෘත්තීය මාර්ගෝපදේශන කවුළුවක් ද ඇතුළත් වන අතර, එහිදී සිසුන්ට, උපාධිධාරීන්ට සහ රැකියා අපේක්ෂිතයින්ට රක්ෂණ කර්මාන්තයේ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳව තොරතුරු ලබා ගැනීමට, වෘත්තීය

උපදෙස් ලබා ගැනීමට සහ සහභාගී වන රක්ෂණ සමාගම් වෙත ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකා සෘජුවම ඉදිරිපත් කළ හැකිය.

රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කුරුණෑගල සහ කුලියාපිටිය ප්‍රදේශවල රක්ෂණ නියෝජිතයින් සහ රක්ෂණ උපදේශකයින් සඳහා විශේෂ දැනුවත් කිරීමේ සැසියක් ද පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම සැසිය මඟින් වෘත්තීය ආචාරධර්ම, වෘත්තීය ප්‍රමිතීන්, නියාමන අවශ්‍යතා සහ යහපත් ක්‍රියාපටිපාටි පිළිබඳ අවධානය යොමු කරමින්, රක්ෂණ ඔප්පුහිමියන්ට සපයන සේවාවේ ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීමට සහාය වීම අරමුණු කරයි.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන, රක්ෂණ ව්‍යාප්තිය වැඩි කිරීම සහ රට පුරා මූල්‍ය සාක්ෂරතාවය සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පුළුල් ජාතික උපායමාර්ගයේ කොටසකි. එමෙන්ම, අධ්‍යාපනය හා දැනුවත් කිරීම තුළින් පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කිරීම සහ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාව ගෙන යන අඛණ්ඩ උත්සාහයන්ට ද මෙම වැඩසටහන සහාය වේ.

මෙම වැඩසටහන, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ග සංගමයේ සක්‍රීය සහයෝගය ඇතිව, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සහ අනෙකුත් රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් සංවිධානය කරනු ලබයි. මෙය, රක්ෂණ පිළිබඳ දැනුම සහ සේවාවන් සඳහා මහජන ප්‍රවේශය පුළුල් කිරීම වෙනුවෙන් රක්ෂණ ක්ෂේත්‍රය සමස්තයක් ලෙස දක්වන ඒකාබද්ධ කැපවීම මනාව පිළිබිඹු කරයි.

මෙම වැඩසටහන්, දිවයින පුරා මීට පෙර සාර්ථකව ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල අඛණ්ඩ දිගුවකි. එම වැඩසටහන් මඟින් වැඩමුළු, අධ්‍යාපනික සැසි සහ ප්‍රජා සම්බන්ධතා ක්‍රියාකාරකම් හරහා දහස් සංඛ්‍යාත පිරිසක් වෙත රක්ෂණ දැනුම ලබා දීමට හැකි වී ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම ළඟා වන බව තහවුරු කිරීම සඳහා මෙවැනි දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි.

මූල්‍ය සුරක්ෂිතභාවය සහ දිගුකාලීන යහපැවැත්ම ළඟා කර ගැනීම සඳහා රක්ෂණය ඉටු කරන වැදගත් කාර්යභාරය පිළිබඳ වටිනා අවබෝධයක් ලබා ගැනීමට, මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වන ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට සහ සියලුම උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ට සාදරයෙන් ආරාධනා කරයි.

**වෙළෙඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)**
**11 වන මහල, නැගෙනහිර කුළුන**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය**
**කොළඹ 01**

| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊ මේල්: info@ircsl.gov.lk |
| දුරකතන: 011 2396184 - 9 | ෆැක්ස්: 011 2396190 |


**21/07/2025**